**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය 2016/2017**

**HIS 4294 - පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාවේ සමාජය හා දේශපාලනය**

**කාලය පැ (02) දෙකයි**

**ප්‍රශ්න <u>තුනකට</u> <u>(03)</u> පමණක් පිළිතුරු සපයන්න.**

---

1. යටත්විජිත සමයේ ඇතිකළ වතු වැවිලිවල සේවයට ගෙන ආ ඉන්දීය දෙමළ ප්‍රජාව විසින් නිදහස් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයට කර ඇති බලපෑම් සමාලෝචනය කරන්න.

2. කුලය, වාර්ගිකත්වය, භාෂාව, ආගම හා ප්‍රාදේශීයවාදය යන කරුණු ශ්‍රී ලංකා දේශපාලනයේ ප්‍රබල සාධකයන්ය. ඉංග්‍රීසි යටත්විජිතවාදීන් ගෙන් නිදහස සඳහා කළ සාකච්ඡාවලදී ඉහත කී කරුණු බලපෑ ආකාරය සමාලෝචනය කරන්න.

3. 1970 දී ජනතා විමුක්ති පෙරමුණ බිහිවීමට පාදක වූ සාධක හා ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලනය තුළ ඔවුන්ගේ කාර්යයභාරය වෙනස් වී ඇත්තේ කෙසේද යන්න විභාග කරන්න.

4. දෙමළ විමුක්ති කොටි සංවිධානය ඔවුන්ගේ යුධ කටයුතු වලදී අනෙක් සටන්කාමී කණ්ඩායම් වලට වඩා ඉහළ ස්ත්‍රී සහභාගීත්වයක් ලබා ගත්තේය, ලාංකේය දෙමළ ස්ත්‍රියගේ සමාජ බලය වෙනස් වූයේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

5. පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලනයට බලපෑ ප්‍රධාන කරුණු දෙකක් වශයෙන්:

    අ) සිංහල ඡන්දදායක ප්‍රජාව ප්‍රධාන පක්ෂ දෙකක් හැටියට බෙදී යෑමත්
    ආ) සිංහල - දෙමළ යන ජනවර්ග දෙක අතර විශ්වාස බිඳී යාමත්

    යන කරුණු ශ්‍රී ලංකාවේ පශ්චාත් නිදහස් ප්‍රජාතන්ත්‍රවාදයට බලපෑ අයුරු සිද්ධීන් සහ පුද්ගලයින් ඇසුරින් විභාග කරන්න.

6. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **<u>දෙකක් (02)</u>** පිළිබඳ සටහන් ලියන්න.
    අ) පශ්චාත් යටත්විජිතවාදය ( Post - Colonialism)
    ආ) නව යටත්විජිතවාදය ( Neo – Colonialism)
    ඇ) සිවිල් ජාතිකත්වය ( Civil Nationalism)
    ඈ) වාර්ගික ආගමික ජාතිකවාදය (Ethno – Religious Nationalism)